# බෞද්ධ සංස්කෘතිය තුළ පුල්ලෙයාර් දේව ඇදහිල්ල
# (නුවරකලාවියේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක් ඇසුරින්)

නවරත්න එස්.ඒ.එල්.අයි. සහ මධුෂිකා ආර්.එම්.එස්.

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
lakmaliishara12@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අස්පර්ශීය උරුමයන් අතර ආගම් පදනම් කොටගෙන ගොඩනැගුණ ආගමික සංස්කෘතිය ඉතා සුවිශේෂීය. ක්‍රි.පූ. 3 වැනි සියවසේදී පමණ මෙරටට ලැබුණ බුදුදහම, එතෙක් පැවති ආගමික සංස්කෘතිය සමඟ සංයෝජනය වූ අතර, එහිදී බුදුදහමේ මූලික ලක්ෂණ තුළට දේව හා යක්ෂ ඇදහිලි යම් තරමකට හෝ ඇතුළත් වී තිබේ. පුල්ලෙයාර් ඇදහිල්ල හෙවත් ගණ දෙවි ඇදහිල්ල ද, එලෙස මෙරට බෞද්ධ ඇදහිලි සමඟ සංයෝජනය වූ තවත් එක් හින්දු දේව ඇදහිල්ලකි. මේ පිළිබඳ සිදුකරන ලද අධ්‍යයනයේදී තොරතුරු අනාවරණය කරගැනීම සඳහා ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණය යොදාගත් අතර අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස අනුරාධපුරය සහ මිහින්තලය යන නුවරකලාවියට අයත් ප්‍රදේශයන් යොදාගන්නා ලදී. මේ ක්‍රමවේදයන් ඔස්සේ ලබාගත් තොරතුරු යොදාගෙන මෙරට බෞද්ධ සංස්කෘතිය තුළ පුල්ලෙයාර් දේව ඇදහිල්ල කොතෙක් දුරට සංයෝජනය වී ඇත්ද? යන්න සහ ඒ සංයෝජනය නිසා මෙරට බෞද්ධ සංස්කෘතියට ලැබුණ බලපෑම් කවරේද? යන්න සොයාබැලීම සහ බෞද්ධ සංස්කෘතිය තුළට සංයෝජනය වී ඇති ජනතාවගේ අවධානයෙන් ගිලිහී යන අස්පර්ෂණීය උරුමයක් වන මෙම පුල්ලෙයාර් දේව ඇදහිල්ල වෙතට ජනතාවගේ අවධානය විචාරශීලීව යොමු කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණයි. නුවණට අධිගෘහිත දෙවියන් වශයෙන් සැලකෙන පුල්ලෙයාර් දෙවියන් සිංහල, දමිළ භේදයකින් තොරව බොහෝදෙනකුගේ ප්‍රසාදයට ලක් වූ දෙවියෙකි. මෙම දෙවියන් අනුරාධපුරය, මිහින්තලය ඇතුළු නුවරකලාවියේ බොහොමයක් ජනතාවගේ ගෞරවයට පාත්‍රවන අතර මෙතුමන් උදෙසා ඉදිකරන ලද කෝවිල් බොහොමයක්, නුවර කලාවියේ මහාමාර්ග හා වැව් ආශ්‍රිතව දක්නට ලැබේ. මෙම පුල්ලෙයාර් දේව ඇදහිල්ල මෙරට බෞද්ධ සංස්කෘතියට සැළකිය යුතු මට්ටමේ බලපෑමක් සිදුකර තිබෙන අතර බෞද්ධ දරුවෙකුට අකුරු කියවන උත්සවයට පවා පුල්ලෙයාර් දෙවියන්ගේ රුවක් එක්කර ගෙන පුල්ලෙයාර් දෙවි පූජාවක් සිදුකිරීමෙනුත් එය මනාව පැහැදිලි වේ. මෙරට සිංහල බෞද්ධ ගැමියා ගොවිතැන් කටයුතුවලදීත්, අසාධාරණයක් සිදු වූ විටදීත්, විභාග, රැකීරක්ෂා සම්බන්ධයෙන් ඇතිවන ගැටලුවලදී සහ තවත් බොහොමයක් කාරණාවලදී පුල්ලෙයාර් දෙවියන්ගේ පිහිට ලබාගැනීමට කන්නලව් කරනු ලැබේ. මේ බව අධ්‍යයන ක්ෂේත්‍රය වූ මිහින්තලය සහ අනුරාධපුරය යන ප්‍රදේශවලදී බහුල වශයෙන් දක්නට ලැබේ. කෙසේ හෝ මෙම අධ්‍යයනයෙන් එළඹිය හැකි අවසන් නිගමනය වූයේ මෙරට බෞද්ධ සංස්කෘතියට කාලයක් තිස්සේ පුල්ලෙයාර් දේව ඇදහිල්ල මඟින් විශාල බලපෑමක් එල්ල කර ඇති බවය.

**ප්‍රමුඛ පද:** *දේව ඇදහිලි, නුවරකලාවිය, පුල්ලෙයාර් දේව ඇදහිල්ල, පුල්ලෙයාර් දේවාල, බෞද්ධ සංස්කෘතිය තුළ පුල්ලෙයාර් දේව ඇදහිල්ල*